අන්දරවැව එල්ලංගා පැතිකඩ හා කළමනාකරණ සැලැස්ම

1.	හැඳින්වීම	3
1.1	ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම:	3
1.2	අන්දරවැව එල්ලංගාව හා එහි පිහිටීම	3
1.3	අන්දරවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා	6
1.4	එල්ළංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු	11
1.5	අන්දරවැව එල්ළංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම	12
1.6	එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම	13
1.7	එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය	16
1.8	එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය	16
1 .9	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමු	16
1.10	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම	17
2.	එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය	17
2.1	අන්දරවැව එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය	18
2.2	තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම	19
2.3	අන්දරවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හදුනා ගැනීම	20
3.	අන්දරවැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ	21
3.1	භූගෝලීය (Geographical) තොරතුරු	21
3.2	භූ විද්‍යාත්මක (Geological) තොරතුරු	21
3.3	පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු	22
3.4	එල්ලංගාවේ පවතින ඉදිකිරීම්	24

3.5	අන්දර වැව එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය	24
3.6	එල්ලංගාවේ කෘෂිකාර්මික කටයුතු	26
4	එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග	27
4.1	උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්	28
4.2	උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හා දළ ඇස්තමේන්තුව	31
5.	උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්	31
6.	අන්දරවැව එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම	34
7.	මැඩිල්ල අමුණ එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තු	34

01. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් ‘‘දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ’’ සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

1.2 අන්දරවැව එල්ලංගාව හා එහි පිහිටීම

අන්දරවැව එල්ලන්ගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව මැතිවරණ කොට්ඨාශයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හෙක් 2090ක භූමි ප්‍රදේශයක් තුල පිහිටා ඇත. ගල්ගමුව එහි ප්‍රධාන නගරය වන අතර ගිරිබාව තඹුත්ත මහ නාන්නේරිය හා වන්නි කුඩාවැව යන උප නගර මධ්‍යයේ මෙම එල්ලංගාව ව්‍යාප්තවේ. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 70ක පමණ දුරින් පිහිටා ඇති ගල්ගමුව නගරයේ සිට කි මී 20 පමන බටහිර දෙසට වන්නට අන්දර වැව එල්ලංගාව පිහිට. ඓතිහාසික රාජධානියක් වන යාපහුවට කිමී.35ක් පමණ උතුරුට වන්නට පිහිටා ඇත. ඓතිහාසික සංගප්පාලය හා හත්පිකුච්චි විහාරය එල්ලංගාව ආසන්නයේ පිහිටා ඇති බෞද්ධ සිද්ධස්ථාන වේ. සංඛපාල යනුවෙන් රජකෙනෙකු පිලිබදවත් පුරාණ අරණ්‍ය සේනාසන, ඓතිහාසික ගල්ගුහා පිළිබදව තොරතුරු අනාවරණය වේ. මගලිය මොග්ගල්යානිය යනුවෙන් සහෝදර රහත් තෙරණියන් දෙදෙනෙක් මෙම ගල්ගුහාවල වැඩ විසු බව සදහන් වේ. ඔරුකද වැව ඉස්මත්තේ මෙම නටබුන් දැකගත හැකිය. ගිරිබාව උණුසුම් කලාපයේ පිහිටි අන්දරවැව එල්ලංගාව නැගෙනහිර සිට බටහිර හා නිරිත දෙයට ව්‍යාප්තවේ. වැව් 27ක් සහ (ඇනිකට්) අමුණු 07කින් යුක්තය. එල්ලංගාව ජලාපවහන රටාවේ දිශාව නිරිත දෙසට වන අතර අන්දර වැව ඇලහර හා මීඔයට ගලා යයි.

වයඹ පලාත



අන්දරවැව එල්ලංගාව වැව් ලේඛනය අනුව වැව් 27 කින් හා අමුණු 7 කින් යුක්තය. මෙම වැව් වලින් 5ක් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ" පුණරුත්ථාපන වැඩ සටහන යටතේ අලුත්වැඩියාවට තෝරාගෙන ඇත. මෙම වැව් වලට අමතරව එල්ලංගාව ආරම්භයේ සිට අවසානය දක්වා ජල සම්පත විවිධ ස්ථාන වල රදවා ගැනීමට පුරාණ ගොවියා මහත් උත්සාහයක් දරා තිබේ. ඒ අනුව එල්ලංගාව ආරම්භ වන ස්ථානයේ සිට ගලා එන ජල මාර්ග හරස් කරමින් ඉදිකර ඇති ලොකු කුඩා ජලාශ බොහෝය. මෙම ජල මාර්ග හා ජලාශ වර්තමානයේත් වෙනස් වෙමින් පවතී එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ජනගහන වර්ධනයත් සමග ඉඩම් අයිතියේ ඇතිවන වේගවත් වෙනස්වීමය. මෙම තත්වය එල්ලංගාවේ තිරසර පැවැත්මට ප්‍රබල බලපෑමක් ඇතිකරයි.

1ආත්තිකුලම වැව

2ගලෙන්බිදුනු වැව

3 ආඩියාකොටුව වැව

4 ගල්ලෑව වැව

5 කුඹුක් වැව

6 සංගප්පාලේ මහ වැව

7 පෙරුම්බඩයාගම වැව

8 ඕරුකන්දේ වැව

9 කුඩාගල්ලෑව වැව

10 හොරොව් වැව

11 අචිරියාව වැව

12 වැලියාගාරේ වැව

Soil Map of Giribawa DS Division - Kurunegala District



ඉහතින් සදහන් වනුයේ අන්දර වැව එල්ලංගාවට අයත් වැව් වලින් කොටසකි .

එහෙත් එල්ලංගාව නිරීක්ෂණයේදි ජල සම්පත් ගබඩා කරගත් කුඩා වැව් 27ක් ඇති බව ලේඛණ වල දැක්වේ. (මුළු වැව් ලේඛනය පහතින් දක්වා ඇත) මෙම වැව් අතීතයේ ඉතා කුඩා ජල මූලාශ්‍ර පදනම් කරගත් පුද්ගලිකව ඉදිකරන ලද වැව් පද්ධතියකි. පසු කාලීණව අදියර කිහිපයකින් වත්මන් තත්වය දක්වා සංවර්ධණය වී ඇත. ඇතැම් වැව් කොහෙත්ම සංවර්ධනයක් වී නැත. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග සියල්ල පැවති බවට ශේෂව පවතින ලක්ෂණ අනුව නිගමනය කල හැකිය. මෙම වැව් බොහෙමයක් අතීතයේදී ඔලගම් වැව් හෝ කුළු වැව් වශයෙන් පවතින්නට ඇත. එහෙත් කාලය ගෙවී යාම හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට වෙනස් වී ඇත. කුළු වැව් වල කුඹුරු අස්වැද්දීම කර ඇත. ඔලගම් වැව් දෙසට ගොවීන්ගේ පදිංචිය ව්‍යාප්තවී ඇත. මෙම සීමාවන් වන සතුන්ට අහිමි වීමත් නිසා වන සතුන්ගේ උවදුරු වගා හානි ඉහල යාම නොවැලැක්විය හැකිය. එල්ලංගාවේ කට්ට කඩුව ගස් ගොම්මන පෝටා වැටිය පෙරහන ගොඩ වල යනාදී ඉතා වැදගත් අංගෝපාංග අද දක්නට නැත. තවද වර්‍තමාන ගොවි ප්‍රජාව මෙම අංගෝපංග පිළිබදව හෝ මෙම අංගෝපංග එල්ලංගා පද්ධතිය තුල පිහිටා ඇත්තේ කුමන හේතුවකටද යන්න පවා අවබෝධයක් නැත. මෙම හේතු නිසා එල්ලංගාව හායනයට පත් වීම වර්ථමානයේදී විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී. අන්දරවැව එල්ලංගාව තල පාංශු ව්‍යාප්තිය පිළිබදව සලකා බලන විට පාංශු වර්ග දෙකක් පැහැදිලිව දක්නට ඇත. ප්‍රධාන පාංශු කාණ්ඩය වන්නේ රතු දුඹුරු පෘථිවි සහ අඩු හියුමික් ග්ලේ පස් සහ රැලි සහිත භූමිය ව්‍යාප්තව පවතී. පාංශ ව්‍යාප්තිය පිළිබදව පහතින් දක්වා ඇති රූප සටහනින් මෙම තත්වය පැහැදිළි කරයි.

1.3 අන්දරවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල කුඩා පරිමාණයේ වැව් රාශියක් පිහිටා ඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් 06ක් නියෝජනය කරයි. සුලු පරිමාණ වැව් 133ක් සම්බන්ධයෙන් එල්ලංගා පද්ධති 06ක් ගිරිබාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංගා පද්ධතිය වැව් හා අමුණු 90කින් සමන්විත පහල ගිරිබාව එල්ලංගාව වන අතර සහභාගිත්ව ගැමි පිවිසුම් වාර්ථාවට අනුව අන්දර වැව එල්ලංගාව වැව් 27ක් හා අමුණු 07කින් යුක්තවේ. මෙම එල්ලංගාව ආසන්නයෙන්ම පිහිටා ඇත්තේ හෙක් 1634 කින් යුත් ගම්පොල එල්ලංගාවයි. ගුරුළුපිටිගම වරාවැව හල්මිල්ල වැව සෙසු එල්ලංගාවන්වේ. පිළිවෙලින් මෙම එල්ලංගා වල විශාලත්වය හෙක් 1510, 2086, 2538 පමන වේ. මෙම එල්ලංගා ද දැනටමත් දැඩි හායනයට මුහුණ දෙමින් පවතී. පුණරුත්ථාපනය සඳහා ව්‍යාපෘතිය මගින් තෝරාගෙන ඇත්තේ අන්දර වැව හා පහලගිරිබාව එල්ලංගා 02 පමනි. විශාල වැව් පද්ධතියක් ඇති මෙම එල්ලංගා වල වැව් සියල්ලම පුණරුත්ථාපනයට භාජනය කල යුතු වුවත් ඒ සඳහා විශාල මූල්‍ය සම්පතක් අවශ්‍ය වේ. තවද මෙම එල්ලංගා නිරීක්ෂණය කරන විට තවත් ලොකු හා කුඩා වැව් රැසක් මෙම එල්ලංගාව තුලින් හමුවේ. මෙම සියලු වැව් වල වාර්ෂිකව රැස්වෙන ජල ධාරිතාවය සලකා බැලිම වැදගත්වේ .එම ජලධාරිතාවය එල්ලංගාවට ගොවීන්ට හා පරිසරයට මහත් සම්පතකි. එල්ලංගාවට ලැබෙන සෑම ජල අංශුවක්ම හැකි තරම් කාලයක් එල්ලංගාව තුලම රදවාතබා ගැනීමට සුදුසු පරිසරයක් පවත්වාගෙන යාමඑල්ලංගා කළමනාකරණ සැලසමේ ප්‍රධාන අරමුණකි. අන්දරවැව එල්ලංගාවේ දළ සටහන අනුව පහත සඳහන් පරිදි වැව් ලේඛණගත වී ඇත. එහෙත් එල්ලංගාවේ පවතින වැව් සංඛ්‍යාව 27 හා අමුණු 07 කි. පවතින මූල්‍ය ප්‍රතිපාදන අනුව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් වැව් 05 ක් පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. තවත් වැව් 4ක් සාෆ් ව්‍යාපෘතිය (කුඹුක් වැව ,ගල්වැව, ආඩියාකොටුවවැව ,ආවිරියාවැව) මගින් පුනරුත්ථාපනය ආරම්භකර ඇත . එහෙත් අන්දරවැව එල්ලංගාවේ වැව් ලේඛණය අනුව වැව් 37ක් හා අමුණු 07කින් යුක්ත බව සඳහන්වේ . එල්ලංගාවේ පූර්ණ සංවර්ධනයකට නම් මෙම සියලු වැව් හා ඊට අදාල සියලු අංග එල්ලංගා කළමනාකරණ සැලසුමකට අනුව සංවර්ධනය කල යුතුය. තවද ප්‍රදේයේ ගොවි ජනතාවට එල්ලංගා කළමනාකරණය පිළිබඳව පුළුල් අවබෝදයක් ලබාදී ඔවුන් එල්ලංගා සංවර්ධනයේ ඍජු හවුල් කරුවන් කළයුතුව ඇත.

අන්දර වැව එල්ලංගාව



එල්ල්න්ගාවේ සංවර්ධනයට හදුනාගත් වැව් (ග්‍රාම නිලධාරී කොට්ඨාශ අනුව එල්ලංගාව)

අංක	වැවේ නම	ගොවීන් සංඛ්‍යාව	අක්කර ගණන	ග්‍රාම නිල:වසම	ගොවි සං නම
01	ආත්තිකුලම වැව			සංගප්පාලය	සංගප්පාල ගොවි සං
02	ගලෙන්බිදුනු වැව				
03	ආඩියාකොටුව වැව				
04	ගල්ලැව වැව			වන්නිකුඩාවැව්	සුරකුම් ගොවි සං
05	කුඹුක් වැව				
06	සංගප්පාලේ මහ වැව			ගම්පොල	
07	වැලියාගාරේ වැව				
0 8	පෙරුම්බඩයාගම වැව				
09	ඔරුකන්දේ වැව				
10	කුඩාගල්ලැව වැව				
11	හොරොව් වැව				
12	අච්චිරියාව වැව				



අන්දර වැව එල්ලංගාව

අන්දර වැව එල්ලංගාව



අන්දර වැව එල්ලංගාව

වගු අංක 1

1. අංක	ග්‍රාම නි. කොට්ඨාශයේ නම හා අංකය	ව්‍යාප්තිය හෙ	ජනගහනය			ප්‍රදේශය තුල ගොවි සංවිධාන
			ස්ත්‍රී	පුරුෂ	එකතුව	
01	සංඛපලය					
02	වන්නිකුඩා වැව					
03	ගම්පොල					

1.4. එල්ළංගාව පිළිබද සාමාන්‍ය තොරතුරු

වගු අංක 2

තොරතුරු	**විස්තරය**
දිස්ත්‍රික්කය	කුරුණෑගල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ගිරිබාව
මැතිවරණ බල ප්‍රදේශය	ගල්ලමව
ගංගා ද්‍රෝණියේ නම	මී ඔය ගංගා දෝණිය
එල්ළංගාවේ නම	අන්දරවැව එල්ලංගාව
ගොවිජන සේවා බල ප්‍රදේශය	තඹුත්ත
ග්‍රාම නිලධාරී වසම්	වන්නිකඩාාවැව,සංගප්පාලය ,තම්මැන්නාව,
එල්ළංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්:	2090
ජලපෝෂක ප්‍රදේශයේ නම	අන්දරවැව
පැහැදිළි ජල පෝෂක සංඛාව	03
කෘෂිකාර්මික කටයුතු සදහා භාවිතාකරණ වැව් සංඛ්‍යාව	වැව් 21 හා අමුණු 07 ක්
වනාන්තර ප්‍රදේශ	හෙ 5.2
මුඩු බිම් (හදුනා නොගත්)	හෙක් 718.4 15
එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව	774
ගෙවතු	හෙක් 470
පුණරුත්ථාපනයට යොමු කල වැව් සංඛ්‍යා	4
පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛ්‍යාව	20 හා අමුණු 7 ක්

1.5 අන්දරවැව එල්ළංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

අන්දරවැව එල්ලංගාව හෙක්ටයාර් 209කින් සමන්විතය වැව් 27ක් හා අමුණු 7කින් යුක්ත වේ. මෙම වැව් මෙතෙක් පුනරුත්ථාපනය කර නැති අතර ව්‍යාපෘතිය් ඉදිරි කාල පරිච්ඡේදය තුල වැව් කිහිපයක් පුනරුත්ථාපනය කිරීමට නියමිතය. මෙම පද්ධතිය තුල කුඹුරු අක්කර 970ක වී වගා කරයි. අතිරේක ආහාර බෝග වගාව යල කන්නයේදී අක්කර242 ක් පමනද මහ කන්නයේදී අක්කර 310 පමන වේ. අතිරේක බෝග වශයෙන් උදු, මුං, කව්පි, තල, කොමඩු හා සුළු වශයෙන් මෙනේරි වගා කරයි . මෙම වගා කටයුතු වල නිරතවන ගොවීන් සංඛ්‍යාව 230ක් පමන වන අතර සමස්ථ ජනගහනය 3096 ක් පමන වේ. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මාණුෂික ක්‍රියාකාර කම් වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්වෙමින් ඇත. කාලයක් තුල සිදුවී ඇති වණ විනාශය අවිධිමත් හේන් හා ගොඩ ඉඩම් වගාව නිසා සිදුවන පාංශු ඛාදනය වැව් ඉස්මත්ත අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු වගා කිරීම වැනි ක්‍රියාකාරකම් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම පාංශු ඛාදනය බලවත් වී ඇත. මෙම හේතු නිසා එල්ලංගාව බලවත් තර්ජනයකට මුහුණ දී ඇත. තවද ජනගහන වර්ධනය හා ඉඩම් බෙදී යාමත් පවතින සම්පත් වේගයෙන් භාවිතයට ගැනීමත් නිසා මෙම ප්‍රදේශවල වැව් ජලය සීඝ්‍රයෙන් සිඳී යාමේ තර්ජනයකට මුහුණ දෙමින් සිටී. ජල මාර්ග සිඳී යමින් දේශගුණික විපර්යාසයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමානවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර ලෙස සංවර්ධනයට හා කළමනාකරණයකට භාජනය කිරීමයි . ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර අන්දරවැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය අන්දරවැව එල්ලංගාව වෙත යොමු කර ඇත. එහිදී එල්ලංගා කලමනාකරණ කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය .එල්ලංගාවේ පවතින මෙම තත්වයේ අනාගත අවදානම පිළිබඳව මෙහි ජීවත්වන ජනතාව නිරන්තරයෙන් දැනුවත් කල යතය. ඒ සමගම එල්ලංගාවේ පහත අත්‍යාවශ්‍ය අංගෝපංග ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුව ඇත. මෙම කාර්යය ඉටුකිරීමේදී ගොවීන් ගොවි සංවිධාන වලට හා අදාල රාජ්‍ය ආයතන වලට විශාල කාර්යබාරයක් පැවරෙන බව අවධාරණය කලයුතුතය. එහි දී අනුගමනය කලයුතු ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් පහත දක්වමි.

1. එල්ලංගාවේ පවතින මෙම තත්වයේ අනාගත අවදානම පිළිබඳව මෙහි ජීවත්වන ජනතාව නිරන්තරයෙන් දැනවත් කිරීම.
2. වැවේ පෝෂිත ප්‍රදේශය සංවර්ධනය. මේ යටතේ ප්‍රමාණවත් වෘක්ෂලතා ආවරණයක් පිහිටුවීම හා පවතින වෘක්ෂලතා කලාපය ආරක්ෂා නිරීම.
3. වැව් ඉස්මත්තේ සිදුකෙරෙනන අණවසර වගාවන් නිසා සිදවන ප්‍රබල පාංශු ඛාදනය අවම කිරීමට පියවර ගැනීම. මෙහිදී වැව තුල අණවසරයෙන් කුඹුරු වගා කරන ගොවීන් ඉවත් කිරීම, වැව ඉස්මත්තේ හේන් වගා බිම් සඳහා පාංශු සංරක්ෂණ වැටි දැමීම, වැව වටා ශක්තිමත් පෙරණයක් (Filter) යෙදීම. පැවතින ගොඩ වල පුණරුත්ථාපනය හෝ අවශ්‍ය ස්ථාන වල ආරක්ෂිත වැටි මගින් වැවට ගලා එන ජලය මගින් ගෙන එන භාරය අවම කිරීම. (වැව ගොඩවීමට බලපාන රොන් මඩ, වැලි සහ මැටි, ශාඛ හා සත්ව කොටස්)
4. වැවේ කට්ට කඩුව, ගස්ගොම්මන, ඉස් වැටිය යන අංගයන් නැවත පිහිටවීම. වැවේ හා වාරිමාර්ග පද්ධතියේ නඩත්තව විදිමත් පරිදි පවත්වාගෙන යාම. වැවේ රාජකාරී සම්බන්ධයෙන් පැරණි සිරිත් විරිත් නීති රීති අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
5. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව මගින් නිරන්තරයෙන් අධක්ෂණය කරමින් තත්වය කළමනාකරණය කිරීම.

6 එල්ලංගාවට හා එහි පැවැත්මට හානි නොවන පරිදි ධරණීය කෘෂි නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

1.6 එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්,"එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

එල්ලංගාවක ආකෘතියක්

එල්ලංගාවක ආකෘතියක් ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.



එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

ඒවා නම්

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,

- ➢ පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
- ➢ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
- ➢ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
- ➢ ප්‍රාදේශීය ලේකම්වරු,
- ➢ ගොවි සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන,
- ➢ ජල සම්පත් මණ්ඩලය,
- ➢ ආපදා කලමණාකරන කාර්යාංශය,
- ➢ පොලිස් දෙපාර්තමේන්තුව,
- ➢ ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය,
- ➢ පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය,
- ➢ ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, ෙපෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත. ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේදක්වා ඇත.

ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.

එල්ලංගා කලමණාකරන කමිටුවක්

1.7 එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩ සටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු වේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වී මේ ආරම්භක පියවරක් ගනු ලැබූවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ඡේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.8 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික චත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා අන්දරවැව එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත.මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක වාර්තාවක් මෙහිදී ඉදිරිපත් කරයි. එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත්වීම, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු සහ සැලැස්ම

ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතනය මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) මෙම වාර්ථාවට ඇතලත් කර ඇත. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම අපේක්ෂා කෙරේ.

1.10 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙළි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හායනයට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම බෙහෙවින් වැදගත්වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදිව දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත්වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

2. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

අන්දරවැව එල්ළංගා පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය. එල්ළංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ළංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ළංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම

පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී. මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2024.08.13 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 4 කින් යුක්ත විය. එල්ලංගාවේ හරස්කඩ චාරිකාව සැලසුම් කරණ ලද්දේ සරළ රේඛාවක් හරහා ගමන් කිරීමෙන් නොව බහු අශ්‍රයක් තුල (Polygon) නිරීක්ෂණය කිරීම වඩාත් ගුනාත්මක දත්ත සපයාගැනීමේ අපේක්ෂාවෙනි. එම දත්ත යොදාගෙන ගුණාත්මක වාර්ථාවක් ලබා ගැනීම මෙහි අරමුණ විය. මේ සඳහා දත්ත සටහන් කරගැනීමට හැකියාව ඇති නිලධාරියකු ව්‍යාපෘතිය මගින් යොදා ගත් අතර මග පෙන්වීම සඳහා ගොවි සංවිධාන නියෝජිතයන් හා ගොවි ජන සංවර්ධන නිලධාරීන් කෘෂිකර්ම නිශ්පාදන සහකාර හා ග්‍රාම නිළධාරීන් මේ සඳහා සහභාගීවූ සෙසු නිලධාරීන් වූහ.

1 කණ්ඩායම අටවරළ හා කැප්පෙටියාව ආශ්‍රිත කලාපය

2 කණ්ඩායම පත්තිනිගම හා ජයවීරගේ වැව ආශ්‍රිත කලාපය
3 කණ්ඩායම නෙලුම්පත් වැව හා විමලදාසගේ වැව ආශ්‍රිත ප්‍රදේශය.
4 කණ්ඩායම තරණගස් වැව හා සුද්දනාගේ වැව ආශ්‍රිත ප්‍රදේශය.
5 කණ්ඩායම නැලැව මහවැව හා නැලැව කුඩා වැව ආශ්‍රිත කලාපය.

කණ්ඩායමේ ක්ෂේත්‍ර වැඩසටහන

කණ්ඩායම 04ක් මෙම චාරිකාවට සහභාගී විය. සැළසුම් කල බහු අශ්‍ර (Polygon) අනුව ක්ෂේත්‍රයේ නිරීක්ෂණ කටයුතු සඳහා මෙම කණ්ඩායම් යොදාගන්නා ලදී. මෙම සැලැස්ම අනුව අන්දරවැව එල්ලංගා පද්ධති සමස්ථ චාරිකාව කිලෝමීටර් 19ක් පමණ විය. මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටු සාමාජිකයින්ට ඉදිරිපත් කර එම දත්ත වල නිවැදිතාවය තහවරු කර ගැනීමට අවශ්‍යවිය. ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු හා සම්පත් භායනයේ බරපතලකම පිළිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නා ලදී. චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගීවූ සියලු පාර්ශවවල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තව දුරටත් තහවුරු කරගනු ලැබීය. විශේෂයෙන්ම මෙම තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත්වේ. තවද එල්ලංගාව පිළිබඳව අධ්‍යනය කරනු ලබන ආයතන හෝ ව්‍යාපෘති වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා තොරතුරු ලබාගැනීමේ දී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධනය සැලසුම් කිරීමේදී මෙම තොරතුරු බෙහෙවින්ඉවහල්වනුඇත.

2.1 අන්දරවැව එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, අන්දරවැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිළිවෙළින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීයහා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ

නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

i. රැස්වීම් පැවැත්වීමට
ii. ද්විතීය දත්ත එකතු කිරීම
iii. හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
iv. එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනී.
v. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
vi. එල්ලංගා පැතිකඩ සැකසීම ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම.
vii. එල්ලංගා සැලැස්ම සැකසීම.
viii. පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම .

එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දළ ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කලමනාකරණ සැලැස්මට ඇතුලත්කර ඇත.

2.2 තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම

එල්ලංගා ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනලදී. (i) රැස්වීම්පැවැත්වීමට (ii) ද්විතීය දත්ත එකතු කිරීම (iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම (iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම (v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම (vi) එල්ලංගා පැතිකඩ සැකසීම (vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර

කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම (viii) එල්ලංගා සැලැස්ම සැකසීම (ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම (x) එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ග කාලීන වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්ම සකස් කර ඇත.

2. 3 අන්දරවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

අන්දරවැව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කලමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ.ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම,දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම,එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ වාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා වාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවානම් 1. භූගෝල විද්‍යාත්මක 2. භූ විද්‍යාත්මක 3. ජල විද්‍යාත්මක 4. පාරිසරික විද්‍යාත්මක 5. මානව හැසිරීම් 6. සමාජ ආර්ථික 7. කෘෂිකාර්මික 8. වාරිමාර්ග කලමණාකරන 9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි. මේවා එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලාංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

3.අන්දරවැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

3.1 භූගෝලීය (Geographical) තොරතුරු

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය දකුණ ඉවුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද, දකුණින් හා නැගෙනහිරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ නවගත්තේගම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයි .මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 200.8ක් වේ. භූ විෂමතාවය අනුව භෞතික භ දර්ශනය සලකා බැලීමේ දී සමස්ථ භූමියම රැළි සහිතපහත්

තැනිතලා වලින් සමන්විත රතු දුඹුරු පස් වලින් යුක්තවේ. හත්තිකුච්චි, සංගප්පාලය ,මයිලැවකන්ද , ගිරිබාව යන කුඩා කඳු යායකින් වටවූ අන්දරවැව එල්ලංගාව කුඹුරු වගාවට ඉතා සුදුසු බිම් ප්‍රදේශයකි. එල්ලංගාව ඛාදනයට හසුවූ භූමියක් බව ප්‍රදේශයේ පවතින ශේෂ වූ විවිධ
භූරූපයන්ගෙන් යුතු ගල් ඇදි හා ස්පටික පාෂාණ වලින් යුතු පහත් බිම් අනුව නිගමනය කල හැකිය.ප්‍රදේශය පාෂාණමය භූ දර්ශනයක් සහිත ඛාදනය වූ තැනිතලාවකින් යුක්තය. එල්ලංගාව පුරා පවතින ගල් ඇදි පොලොව මතුපිටට පැමිණ පිහිටා ඇති අතර තුනී පස් තට්ටුවක් පිහිටා තිබීම නිසා සෙසු ප්‍රදේශ වලට වඩා උෂ්නත්වය ඉහල මට්ටමක පවතින අතර භූගත ජල මට්ටම ඉතා පහල මට්ටමක පවතී. පානීය ජලය හා කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය දැඩි හිගකමක් පවතී. පාංශු තට්ටුවට යටින් පවතින පාෂාණ තට්ටුව නිසා ළිං කැණීමද දුෂ්කරය. එල්ලංගා වාසීන් උෂ්නත්වයෙන් හා නියගයෙන් පීඩා විඳිති. මෙහි ව්‍යාප්තව පවතින හුදකලා කඳු පංතිය උන්නතාංශය අනව මීටර් 65 සිට 850 දක්වා පරාසයකින් යුක්ත වේ. මෙම කලාපය අර්ධ ශුෂ්ක දේශගුණික කලාපයේ පිහිටා ඇති බව ඇතැම් මූලාශ්‍ර පෙන්වා දෙයි. කෙසේ වෙතත් මෙම කලාපය ශ්‍රී ලංකාවේ වියළි දේශගුණ කලාපයට අයත් වන අතර කෘෂි පාරිසරික කලාපය DL1 වේ. දකුණු මායිමට ආසන්නව පිහිටා ඇති උපරිම උන්නතාංශය අඩි 315ක් වන අතර. අඩි 212ක් පමණ වන අවම උන්නතාංශය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ දී පවතී .**අන්දරවැව**එල්ලංගාව තරමක් විශාල එල්ලංගාවකි. එහි වැව් 27 හාඅමුණු 07 ක් පිහිටා ඇති අතර එල්ලංගාව නැගෙනහිර සිට බටහිර දෙසට කි.මී. 12ක් පමන දක්වා විහිදී යයි. විශේෂිත උස් කඳු වැටි ප්‍රදේශය වටා දක්නට ඇති අතර එම කඳු හා අශ්‍රිත ප්‍රදේශ වලට ලැබෙන වර්ෂාපතනය පවතින උන්නතාංශය අනුව ගලා යන ජලයෙන් වැව් පෝෂණය වේ. ස්වාභාවික වනාන්තර ප්‍රමාණය අක් 13 පමණ වේ. එල්ලංගාව තුල ගෙවතු වගාව හා නිවාස කෘෂිකාර්මික ඉඩම් පිහිටා ඇත. ලැබෙන වර්ෂාපතනය මෙම භූ විශමතාවය අනුව වේගවත්ව වැව් තුලට ගලා යයි. ප්‍රදේෂයේ පවතින්නේ රැලි සහිත භූමියකි. මෙම භූ විශමතාවය අනුව ලැබෙන වර්ෂාපතනය වැව් වලට එක්වනවා හැර විශේශිත ජල මාර්ග හෝ ඇලවල් පිහිටා නැත. **අන්දරවැව** එල්ලංගාව මෙන් ම ප්‍රදේශයේ සෙසු එල්ලංගා වලින් පිටතට ගලායන ජලය මී ඔයට එකතුවේ. මෙම එල්ලංගාව ද මුලුමනින්ම ඉගිනිමිටිය ජලාශයේ පෝෂිත ප්‍රදේශක් ලෙස සැලකිය හැකිය.

3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

අන්දර වැව එල්ලංගාව හෙක්ටයාර් 2090 කින් යුක්තය. වැව් 27 හා අමුණු 07 කින් යුත්තය. ජනාවාස අතර ලඳු කැලෑව මෙම එල්ලංගාව තුල දක්නට ඇත. ගිරිබාව ප්‍රා ලේකම් කොට්ඨාශයේ භූමිය මෘදු බෑවුමක් හා රැලි සහිත තැනිතලාවකි. ජලාපවහන රටාව ප්‍රධාන වශයෙන් මී ඔය ගංගාද්‍රෝණියේ හා සම්බන්ධ වන අතර එය වැව් මූලාශ්‍ර කරගත් පද්දතියක් වේ. ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජල මාර්ග බොහෝ ස්ථානවල අවහිරකර ඇති අතර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩාවැව් හා අමුණු රාශියක්ඉදිකරඇත. අමුණු පද්දතියක් පිහිටා ඇත්තේ මේ නිසාය.
වැසි සමයේ දී, ජලය වේගයෙන් ගලායාම නිසා දැඩි පාංශු ඛාදනයක් සිදුවේ. මෙම එල්ලංගාව තුළ ඇති සියලු වැව් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් අතහැර දමා ඇති ඔලගම් වැව් ලෙස සැලකිය හැකිය. එහෙත් මෙම. වියළි කාලවල දී භූගත ජලමට්ටම අඩි 35 -40ක් පමණ දක්වා පහල බසී. වැව් ආශ්‍රිතව කුඹුරු වගාව දක්නට ලැබේ. මෙම තත්වය නිසි කළමනාකරණයකින් තොරව සිදුවන බැවින් එල්ලංගාවේ හායනයට හේතු වී ඇත. කෘෂි ළිං සහ නළළිං වලින් ජලය ලබාගැනීම සිදුවුවද වගාවට ප්‍රමාණවත් නොවේ. වර්ෂාවෙන් ලැබෙන ජලය කාලීණ ජල මාර්ග ඔස්සේ ගලා ගොස් සුලු කාලයකින් සිඳීයයි. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලය ද ඉතා කෙටි වන්නේ වැව් ඉස්මත්තේ නිසි පෝෂිත ප්‍රදේශයක් නොපවතින නිසාය. මේ නිසාම වැව් ගොඩවීමට මෙම තත්වය හේතු වී ඇත. ස්වාභාවික වනාන්තර දක්නට නැත. කෘෂිකාර්මික අවශ්‍යතාවයන් මෙන්ම අනවසර දැව කැපීම නිසා වැව් ඉස්මත්තේ පවතින වන සම්පතද අනතුරට පත්වෙමින් ඇත. මෙම තත්වයට ප්‍රබල හේතුවක් වී ඇත්තේ අදාල රාජ්‍ය මැදිහත් වීම් ප්‍රමාණවත් නොවීම හා ප්‍රතිලාභීන් දැනුවත් නොවීමයි නිසාය.

3.3 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

එල්ලංගාව හා කලාපීය වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකිවේ. මෙය තුල පවතින වැව් සියල්ලම පාහේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනී. එහෙත් මෙම වැව් වල පවතින්නේ ඉතා අඩු ජල ප්‍රමාණයකි. රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින හා ඔවුන්ගේ ගම්මාන වගා බිම් වලින් යුක්තය. එහෙත් ප්‍රදේශයේ බොහොමයක් ගොඩ ඉඩම් වගා කරන්නේ වර්ෂාවත් සමග මහ කනන්යට පමණි හේන් වගාවට සුදුසු පරිදි භූමිය සකස් කර ඇත. පරිසරයහොදින් එළිපෙහෙළි කර ඇති අතර ඇතැම් අතහැර අත්හැර දමන ලද හේන්ය. එහෙත් මේවා කලින් කලට සක්‍රීය වේ. උඩ හා බිම පැල් දක්නට ඇත. එල්ලංගාවේ ජනගහනය පදිංචි ප්‍රදේශය එක් ප්‍රදේශයකට සීමාවී ඇත්තේ වල් අලින් ගෙන් සිදුවන අනතුරු නිසාය. වනය ආසන්නයේම සිටි ගම්මුන් ගම අතහැර ආරක්‍ෂිත ප්‍රදේශයේ පදිංචිව සිටී. එහෙත් දර කැපීම හා වෙනත් කටයුතු වලට නිතර හේනට යාම ඔවුන්ගේ සිරිතවී ඇත. කෙසේ වුවත් දැව ජාවාරම් කරුවන් කරත්ත කරුවන් ට්‍රැක්ටර් ප්‍රදෙශයේ වනය දෙසට යනු දැකිය හැකිය. බොහෝමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපාංග දක්නට නැත. වාර්ෂිකව වැව් ඉස්මත්තෙ කුඹුරු වගාව නිසා සේදී පහලින් පිහිටි වැවට එකතු වන වැලි රොන්මඩ හා පස් අංශු අති විශාලය. මෙහි ඉස්වැටිය පෙරණය ගොඩවල අක්‍රීය වී ඇත වැව් ඉස්මත්ත සීමාවක් දක්නට නැත. මුලුමනින්ම අනවසර අල්ලා ගැනීම් වලට ලක් වී ඇත. වැව ඇතුලත පැහැදිලිව අනවසර කුඹුරු දක්නට ලැබේ. මෙම අනවසර ඉඩම් වලට තාවකාලික අනවසර බලපත්‍ර පවා නිතුත්කර ඇත. මෙම අනවසර බලපත්‍ර ඔප්පු ලෙස දක්වමින් ඉඩම් කොටු කර ගැනීම ට ගොවීන් කූට පුද්ගලයන් පෙළඹී ඇත. වැව ඉස්මත්ත පදිංචිය සඳහාත් භාවිතා කිරීමත් වෙනත් නොයෙකුත් අක්‍රමිකතා සඳහා බාවිතා කරමින් වැව ගොඩකරන ගොවීන් ඇත. වැව ඉස්මතත පස් කැපීම පවතින ස්වාබවික පෙරහණ විනාශ කරදමා ඇත. ගස් කැපීම හා වැව් රක්ෂිතය අනවසර යෙන් අල්ලාගෙන ඇත. ළිං කැපීම වැව් තුල විවිධ වගාවන් පවත්වාගෙන යාම දක්නට හැකිය. කීරිය, කොහොඹ , දං , කෝන් පලු වැනි වෘක්ෂලතා දක්නට ඇත.

වර්ථමානය වනවිට වැව් හා අදාල පද්ධතිය සම්පර්ණයෙන්ම වල් බිහිවී ඇත. ඊට අදාල වැව් මානා ඉලුක් හා වෙනත් කැලෑවට යටවී ඇති මුලු පරිසර පද්ධතියම මේනිසා වල් බිහිවී ඇති අතර වනඅලින්ට මෙය කදිම තෝතැන්නකි. වාරිමාර්ග පරිසර පද්ධතිය නඩත්තු කරගැනීමට ගොවි සංවිධානවලට අවශ්‍යතාවයක් හෝ හැකියාවක් නොමැති බව මෙයින් පෙනේ. විශාල වියදමක් දරමින් කර ඇති අලුත්වැඩියාවන් ඉතා කෙටිකලකින් විනාශ වී යා හැකිය.

ගම තුල නිරන්තරයෙන් ගොඩනැගිලි ඉදිවෙමින් පවතී වෘක්ෂලතා ආවරණය පවතින්නේ 10 % පමන වේ. වන සංරක්ණ දෙපාර්තමේන්තුවට අයත් වන සංරක්ෂණ කලාප සුලු වශයෙන් පැවතියද අනවසර දැව කැපීම් බහුල බව පරිසර අධ්‍යනයේදී ගම්‍ය විය. මෙම එල්ලංගාව තුල මීට වසර 03 කට පෙර පැවති මුලු ජනගහනය 9ක් පමන විය. ක්‍රමයෙන් සිදු වන මෙම ජනගහන වර්ධනයත් සමග එල්ලංගාව තුල තව තවත් වෙනස් භූමි දර්ශනයන් ඇති විය හැකිය. බොහෝ ඉඩම් එලිපෙහෙලි කිරීමත් සමග අන්දරවැව එල්ලංගාව අක්‍රීය වනු ඇත මෙම තත්වය පාලනය කර ගැනීමට එල්ලංගා කළමනාකරණ කමිටුවටත් ගොවි සංවිධාන හා ගොවීන්ගේත්, අකනෙකුත් ප්‍රතිලාභීන්ගේත් සහයෝගය හා වගකීම අත්‍යාවශ්‍ය වේ. සතුන්ගෙන් සිදුවන හානිය (රිළවුන් අලින් හා ඌරන්) ඉතා විශාලය. මේ නිසාම ගොවීන් වෘක්ෂලතා සිටුවීම සම්බන්ධයෙන් දක්වන්නේ අකමැත්තකි. රිළවුන් මොණරුන් හා අලින්ගේ ගැවසීම නිසා ගස් හා පදුරු කපා දැමීමට ගොවීන් පෙලඹී ඇත. ඌරන් හා මුවන් දඩයම් කිරීම ද දැකිය හැකිය. මෙම සත්ව හානි නිසා ගොවීන්ගේ අස්වනු හානිවීමත් සැලකිල්ලට ගත යුතුය. මොණරුන් ගහනය වැඩිවීම නිසා සර්ප ගහණය අඩුවී ඇත. මේ නිසා සර්පයන් දෂ්ට කිරීමෙන් සිදුවන පුද්ගල ජීවිට හානි අඩුවී ඇත.

3.4 එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාවේ විශේෂිත ඉදිකිරීම් දක්නට නැත. එහෙත් ගම් වාසීන්ගේ නිවාස තැනීම් සිදුවේ. මෙම ගොඩනැගිලි ඉදිවන්නේ ස්ථිර ගොඩනැගිලි ලෙසිනි. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. මෙම වැට ගොවීන් විසින්ම සකස් කරගන්නා ලද අවිදිමටත් වැටකි. තවද ඉඩම් කැබලි වීමද වේගවත්ය. ගොඩ ඉඩම් වල සිදුවන පාංශු තට්ටුව කැපීම ළිං කැපීම හා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂයෙන් මහ කන්නයේ හා හදිසියේ ඇතිවන සංවහන වර්ෂාව සිදුවන අවස්ථා වලදී වේගවත් ව ජලය ගලා යාමත් සමග පාංශු ඛාදනයක් ඇතිවේ. මෙම ඛාදනයත් සමග රොන්මඩ හා පාංශු කොටස් වැව් වල තැම්පත්වීම වැලැක්විය නොහැකිය. අවිධිමත් වගාබිම් ව්‍යාප්තිය එල්ලංගාව තුල දක්නට ඇත. ගල් කැඩීම හා ගඩොල් කැපීමත් දැකගත හැකිය. සෑම වගා ඉඩමකම ගස් උඩ පැලක් හා අලිවැටක් ඉදිකර ඇත. වගා බිම් හා බොහෝ අවදානම් ස්ථානවල අලිවැට ඉදිකර ඇතත් මේවා විධිමත්ව ඉදිකරන ලද වැටවල් නොවේ. එල්ලංගාව මුලුමනින්ම පාහේ ජනාවාසවලින් යුක්ත වනහෙයින් නිරන්තරයෙන් නිවාස ඉදිකරමින් හා වැඩිදියුණු කිරීම් පවතී. තවද ඉඩම් කැබලිවීමද වේගවත්ය. ගොඩ ඉඩම්වල සිදුවන පාංශු තට්ටුව කැපීම ළිං කැපීම හා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂයෙන් මහ කන්නයේ හා හදිසියේ ඇති වන සංවහන වර්ෂාව සිදුවන අවස්ථාවලදී වේගවත්ව ජලය ගලායාමත් සමග පාංශු ඛාදනයක් ඇතිවේ. මෙම ඛාදනයත් කන්නයක් පාසා කුඹුරු වගාවත් සමග රොන්මඩ හා පාංශු කොටස් වැව්වල තැම්පත්වීම බහුලවී ඇත. වැව් ඉස්මත්තේ හේන් වගාවද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයකි. මෙහිදී විධිමත් පාංශු සංරකෂණ ක්‍රම අනුගමනය කලයුතුය.

3.5 අන්දර වැව එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 27 කි. වැව් 6 ක පුනරුත්ථපන කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇතෙ. මීට අමතරව තවත් වැව් 03 පුණරුත්ථාපනය කිරීමට සැලසම් සකස් කරමින් පවතී. මෙම වැව් වලින් බොහොමයක් අතීතයේ ඔලගම් වැව් වශයෙන් පවතින්නට ඇති බවට හඳුනාගත හැකිය.

අංක	වාවේ නම	අක්කර	ගොවි: සං:	ගොවි සං නම	ග්‍රාමනිළකොට්
1	මීගහවැව	20	25		

2	ආඩියා කොටුව වැව	86	80		
3	දසනායකගේ වැව	15	12		
4	ගල්ලැව වැව	65	58	SAF	
5	රඹාවැව	40	18		
6	සන්ගප්පලය මහවැව	104	100		
7	කුඹුක්වැව	73	70		
8	ඔරුගලවැව	18	18	CSIAP	
9	ගලෙන්බිදුනුවැව	15	12		
10	කුඩා ගල්ලැවවැව	22	18		
11	පහන් වැව	6	7		
12	කුඩා ගල් වැව	24	21		
13	මහවැව				
14	කන්දෙ වැව				
15	පෙරුම්බදයගම වැව				
16	වෙලියාගාර වැව				
17	අත්දඩුවාව වැව				
18	මීගහ වැව				
19	සාගතවැව				
20	බෙදුරු වැව				
21	ආචිරියව වැව				
22	වන්නිකුඩා වැව				
23	තම්මැන්ණාව වැව				
24	හොරොව් වැව				
25	බතල වැව				
26	අමුනුකොලේගම				
27	මුත්තම්මගේවැව				

ඉහත වගු සටහන අනුව මෙම වැව් යටතේ ඇති කුඹුරු අක් 03 සිට අක් 72 දක්වා පරාසයක් පුරා පවතී යි. සංගප්පාලය වැව යටතේ අක්කර 104 ක් කුඹුරු වගා කරයි. එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබඳව වැදගත් කමක් ඇත. විශේෂයෙන්ම වැව් 04 ක හැර සෙසු වැවු වල සැලකියයුතු ගොවීන් සංඛ්‍යාවක් ඇත. එහෙත් මෙම වැව් වල නඩත්තව ඉතා දුර්වල බව සඳහන් කලයුතුය. ඇලවෙලි හා වැව් බැම්මේ නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදුනොවේ. මෙයට හේතුව වන්නේ වැව යටතේ වගා කටයුතු බොහෝදුරට වසරකට එක් කන්නයක් පමණක් වගකිරීමයි.මේ නිසා කන්නයට වරක් වත් නඩත්තුව නිසිපරිදි සිදු නොවීමයි. තවදා එක් ගොවි සංවිධානයකට වැව් කිහිපයක කළමනාකරණය කිරීමට සිදුවී ඇත. මෙම තත්වය නඩත්තුව දුර්වල වීමට තවත් හේතුවක් වී ඇත. ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය ද නඩත්තුව දුර්වලවීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය ද මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වය සෘජුවම බලපාන ලබයි (එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්තිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත. බෙහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත . මෙය වාරිමාර්ග පද්දතියේ කළමණාකරණයට බලපාන්නාවූ හේතුවේ) ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේදීය. ඇතැම් ජල පාලකයන් එක දිගට ම කිහිප වරක් පත්වෙන්නේ ගොවීනන්ගේ කැමැත්තෙනි. පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු

ලැස්තුව අනුව බෙදා ඇත. මෙම නියමයන් බොහෝදුරට ලේඛණ වලට පමණක් සීමාවී ඇති බව කිවයුතුව ඇත. ඇළවේලි හා වැව් බැමි කැලැවෙන් වැසී ඇත. අතැම්වැව් බැමි වසර ගණනාවකින් නඩත්තු කර නැත. එම වැව් බැමි වල කිසිසේත්ම ගමන් කල නොහෙකිය මෙම වැව් කුළු වැව් හෝ ඔලගම් වියහැකිය. වාරිමාර්ග කළමනාකරණයේදී වගා ක්‍රම හා තාක්ෂනය බලපනුලබයි. මෙම නව තාක්ෂනය පිලිබඳව ගොවීන් දැනුවත් වී නැත. එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය, නව තාක්ෂණය හා උපකරණ, භූමි පරිබෝග රටාව, වගා ක්‍රම යන කරුණු පිලිබඳව ගොවීන්ට විදිමත් ප්‍රායෝගික පුහුණුවක් ලබාදිය යුතුය.

මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත සලාරිස් ලැබිය යුතු වුවත් එවැන්නක් සිදු නොවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්බ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ බෙත්මට වී වගා කෙරේ. මෙය වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිලිබඳව දුර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුවට ගොවි සහභාගිත්වයේ විශේෂ දුර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳව සැලසුමක් හෝ අරමුදලක් පවත්වාගෙන යන බවක් නැත. තවද සංවිධාන වල අරමුදල් වර්ධනය වීමක් ද නැත. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්දව නීතිමය පියවර නොගැනීමත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය. ජලය බෙදාහැරීමේදී හා පද්ධතිය නඩත්තු කටයුතු වලදී ගොවි සහබගිත්වය නොලැබීමට මෙය හේතුවේ.

3.6 එල්ලංගාවේ කෘෂිකාර්මික කටයුතු

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේහි මහ කන්නයේ සාමාන්‍ය වර්ෂාපතනය වර්ෂවලදී එල්ලංගා වල වැව්වල සියලුම පෝෂක ප්‍රදේශවල වගාකරන ප්‍රධාන බෝගය වී වේ. එල්ලංගා වල වැව්වල ජල ගබඩා ධාරිතාව අනුව වැව් පෝෂක ප්‍රදේශවල ප්‍රමාණයන් විවිධාකාර වී ඇති අතර මූලික වශයෙන් වී වගාව මහ කන්නවලට පමණක් සීමා වේ. යල කන්නය සඳහා සීමිත ජල ප්‍රමාණයක් ඇති එල්ලහාවේ වැව් සීමිතය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගොවීන්ට වගා ප්‍රමාණය සීමා කිරීමට හෝ ලබා ගත හැකි ජලය අනුව බෝගය වෙනස් කිරීමට සිදු වේ. අන්දරවැව එල්ලංගාවේ වැව් කිහිපයක්, කායන් වැව, කුළු වැව, සහ පින් වැව වණ අතර මෙම වැව් වලට කුඹුරු ප්‍රදේශ නොමැත. මෙම වැව් පිළිබඳ විස්තර ලබා දී ඇති වැව් ලැයිස්තු වල සහ ඒවායේ ප්‍රමාණ අනුව සඳහන් වේ. වගුව 5.08ට අනුව සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සහ නියං කාල වල කන්න අනුව සිදුකෙරෙන බෝග රටා දැක්වේ. වගුවේ ඇති දත්ත වලට අනුව සාමාන්‍ය වර්ෂාපතනය සහ නියං වර්ෂ අතර වගා බිම් වල වෙනස පැහැදිලිව පෙන්නුම් කරයි. මහ කන්නයේ වී සහ අනෙකුත් සෘතුමය භෝග වගා කරනු ලැබුවද, වර්ෂාපතනය සහ කුඩා වාරිමාර්ග වල කුඩා වැව් මෙන්, වියළි සමයේදී, යල, වැසි ජලය හා වැව් වාරිමාර්ග නොමැතිකම නිසා වගාවක් සිදු නොවේ. මේ අනුව, වියලි කලාපයේ සියලුම එල්ලංගා සංවර්ධනය කළ යුතු අතර එය ජලය ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීමට සහ වියලි කාලය අඩු කිරීමට සහාය වනු ඇත.

අන්දර වැව එල්ලංගාවේ බෝග සාමාන්‍ය වර්ෂාපතන වර්ෂ නියඟ වර්ෂ				
බෝග	සාමාන්‍ය වර්ෂාපතන වර්ෂ		නියඟ වර්ෂ	
යල (අක්කර)	මහ (අක්කර)	යල (අක්කර)	මහ (අක්කර)	
වී	225	805	00	00
රටකජු	105	165	00	00
බඩඉරිඟු	05	80	00	00
තල	71	0	00	00
මුං	20	23	00	00
කවුපි	22	20	00	00

මුළු	448	1,093	00

මූලාශ්‍රය :PRA

සෘතු අනුව උස්බිම් සහ වාසස්ථානවල බෝග රටාව විස්තර කරයි. දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ වලට අනුව, අන්දරවැව එල්ලන්ගාවේ මහ කන්නයේ දී පමණක් සෘතුමය බෝග වගා කර ඇත. තුනී පාංශු ස්ථර සහ පාෂාණමය හා ගොඩ ඉඩම් වගා කිරීම සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වේ. අනෙක් අතට, පාංශු ස්ථරය අනුව කෘෂි ළිං හාරා ගැනීම ඉතා අපහසුය. සමහර ගොවීන් භූගත ජලය සඳහා නළ ළිඳ භාවිතා කරයි. දත්ත වලට අනුව, බොහෝ දුරට උස්බිම් සහ ගෙවතු වගවන්හිදී සියලු එල්ලංගා වල නිසි හා සැලසුම් සහගත වගා පද්ධති නොමැත. යල කන්නයේදී වෙනත් වගාවක් වෙත ගොවින් යොමු කල යුතුය. උඳු, මුන්, කව්පි, තල වැනි අතිරේක අහාර භෝග යලට වගා කිරීමට ගොවීන් යොමු කිරීමට වැඩ සැලැස්මක් සංවිධානය කලයුතුවේ. මේ තුලින් යලට ගොවීන්ට අතිරේඛ අදායමක් ලබාගැනීමට හැකියාවක් ලැබේ .

දත්ත වලට අනුව වාර්ෂිකව පොහොර භාවිතය සියලු භෝග සඳහා සමාන්‍යවේ. වර්ගය, බෝග සහ කන්න අනුව අක්කරයකට සාමාන්‍ය පළිබෝධනාශක සහ වල්නාශක භාවිතය පෙන්නුම් කරයි. සමහර ගොවීන් වඩා හොඳ අස්වැන්නක් සඳහා වැඩි කෘෂිරසායන භාවිතා කිරීමට ඇබ්බැහිවී ඇත. අපගේ නිරීක්ෂණවලට අනුව ගොවීන්ගෙන් බහුතරයකට කෘෂිරසායන හා කෘෂිරසායන භාවිතය පිළිබඳ විද්‍යාත්මක අවබෝධයක් නැත. මෙය අවසානයේ වකුගඩු රෝගය සහ මෙම නිෂ්පාදනවල ගොවීන්ගේ සහ පාරිභෝගිකයින්ගේ විවිධ වර්ගයේ රෝගාබාධ නිසා ඇති විය හැකිය. මේ අනුව කෘෂි ව්‍යාප්ති කටයුතු වල අවශ්‍යතාවය ඉහල මට්ටමක පවතී. තවද මහ කන්නයේදී වන සතුන්ගෙන් වගාව ආරක්ෂා කරගැනීමට ගොවීන්ට මහත් වෙහෙසක් දැරීමට සිදුවන නිසා යල කන්නයෙදීත් තව දුරටත් මෙම අපහසුතාවය විදීමට ගොවීන්ට සිදුවෙන නිසා යල වගාව අතහැරදැමුවා විය හැකිය .

4 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

අන්දරවැව එල්ලංගාවේ පැවති හරස්කඩ චාරිකාවේදී මෙන්ම ගොවි සංවිධාන හා නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණදෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකිවිය . එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසු ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේදී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකිවිය. මෙසේ හඳුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත. තවද උපාය මාර්ගික මැදිහත්වීම් හා මැදිහත්විය යුතු ආයතන පිළිබඳව තක්සේරුවක් කර දළ ඇස්තමේන්තුවක් සකස් කර කාල රාමුවක්ද අමුණා ඇත. මෙම වාර්ථාව එල්ලංගා කළමනාකරණ කමිටවට ඉදිරිපත් කර සාකච්ඡා කර ක්‍රියාවට නැංවිය යුතුවේ. මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීමට ගොවිජන සංවර්දන දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන මූලිකත්වය ගත යුතුවේ. එමෙන් ම එල්ලංගා කළමනාකරණ කමිටුවේ මූලිකත්වය ද ප්‍රධානවේ.

4.1 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

අනු අංක	උග්‍ර ගැටළු	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්	මැදිහත්විය යුත ආයතන
1	මෙම වැව් වල ජලය වගාවට ප්‍රමාණවත් නැත. (වාන පාහත් කරලා) පනාදරගම වැව කුඩා වැව	I. කොන්ත්‍රාත් කරුන්වන් පාර්ෂව කරුන්වන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම. II. රැඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම.	1ගොවි සංවිධාන 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ 5 කෘ දෙ
2	කට්ටකඩුව හා පෙරණය නැත. (පනාදරගම වැව කුඩා වැව. තම්මැන්නාව අංකිරිප්පුව)	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම II. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම . III. කට්ට කඩුව නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ට කඩුව වෙන් කිරීම. IV. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම.	1ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ
3	රක්ෂිත අල්ලාගෙන ඇත (පනාදරගම වැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව)	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම II. ඒකාබද්ධ සැලසුමක් සකස් කිරීම III. වැව් මැන සළකුණු කිරීම IV. අණවසර කරුන්වන් ඉවත් කිරීම	1 ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ 5 ප්‍රාදේශීය ලේකම්
4	ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම. (කුඹුරු විනාශවී ඇත පනාදරගම.)	I. කොන්ත්‍රාත් කරුන්වන් පාර්ෂවකරුන්වන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම. II. අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම. III. ඇස්තමේන්ත සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම IV. කොන්ත්‍රාත් ගොවි සංවිධානයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව.	1 ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ

5	පුණරුත්ථාපණයේ දී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවක සේදී වැවට එකතු වී වැව ගොඩවීම. (wä 4 muK￠ස È. óg¾ 300 පමණ) mkdor.u	I. කොන්ත්‍රාත්කරුන්වන් පාර්ෂව කරුන්වන් භාව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම. II. රැඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම.	1 ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ
6	කෘෂි පාර නැත (කට්ටකඩුව සිට අංකිරිප්පුව දක්වා මී 500 හා පකාදරගම වානේ සිට කුඹුරු දක්වා කෘෂිපාර නැත මී 750)	I. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබා ගැනීම III. ප්‍රතිපාදන සපයා ගැනීම IV. ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම	1 ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග
7	අංකිරිප්පුව වාවේ පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් නරලා අක් 01 ට ජලය ගන්න බැ	I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා කොන්ත්‍රාත් කරුවන් මගින් නැවත ඉදිකිරීම	1 ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ

8	වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්ත ඉතා දර්වලයි	I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම II. නඩත්ත සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම	ගොවි සංවිධාන (CMC) 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග
9	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම.	I. CMC හිදී සාකච්ජා කිරීම. II. අදාල වැව් හදුනා ගැනීම. III. කෘ දෙ උපදෙස් ලබාගැනීම IV. ඇස්තමේත්තු කිරීම V. සුදුසු කෘමිනාෂකයක් යෙදීම	1ගොවි සංවිධාන 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ 4 කෘ දෙ

4.2 උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හා දළ ඇස්තමේන්තුව

5. වගු අංක 11- උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

අනු අංක	උග්‍ර ගැටළු හා ගැටළුව පවතින ස්ථාන	දළ ඇස්තමේන්තුව මි.	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්	මැදිහත්වීම
01	වැවේ ජලය වගාවට ප්‍රමානවත් නැත. (වාන පහත්) පනාදරගම වැව කුඩා වැව	0.3	i. CMC හිදී අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම. ii. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම. iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. iv. අවශ්‍ය නම් ප්‍රතිපාදන සපයා ගැනීම. v. කොන්ත්‍රාත් ගො සං පැවරීම. අධීක්ෂණය.	1.ගොවි සංවිධාන 2.CSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා 5. CMC
02.	කට්ටකඩුව හා පෙරණය නැත. (පනාදරගමවැව කුඩා වැව. තම්මැන්නාව අංකිරිප්පව)	0.2	i. CMC හිදී සාකච්ජාවට ගැනීම. ii. අවශ්‍ය වැව් තෝරා ගැනීම . iii. ගොවීන් දැනවත් කිරීම. iv. ඒකාබද්ධව කට්ටකඩව වෙන් කිරීම. v. පැල හා සඳහා ප්‍රතිපාදන සපසා දීම. 6අධීක්ෂණය .	1. ගොවි සංවිධාන 2. CMC සහCSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා

03.	රක්ෂිත අල්ලාගෙන ඇත පුද්ගලික පාරකට යොදාගෙන (පනාදරගමවැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව)	0.3	i. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම. ii. ඒකාබද්ධ සැලසුමක් සකස් කිරීම iii. වැව් මැන සළකුණු කිරීම iv. අණවසර කරුවන් ඉවත් කිරීම	1.ගොවි සංවිධාන 2.CSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා 5. CMC
04.	ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම .(කුඹුරු විනාශවී ඇත පනාදරගම .)	0.4	i. පාර්ෂව කරුවන් හාව්‍යාපෘති නිධාරීන් සමග CMCහිදී සාකච්ජා කිරීම . ii. අදාල ස්ථාන හදුනා ගැනීම. iii. ඇස්තමේන්ත සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම iv. කොන්ත්‍රාත් ගොවි සංවිධානයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව .	1. ගොවි සංවිධාන 2. CSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා 5. CMC
05.	වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවක සේදී වැවට එකත වී වැව ගොඩවීම (wä 4 muKළස È. óg¾ 300 පමණ) mkdor.u	0.3	i. පාර්ෂව කරුවන් හාව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදීසාකච්ජා කිරීම . ii. ඇස්තමේන්ත සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම iii. කොන්ත්‍රාත් ගොවි සංවිධානයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව .	1.ගොවි සංවිධානකරුවන් 2.CMC සහ CSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා

06.	කෘෂි පාර නැත (කට්ටකඩව සිට අංකිරිප්පව දක්වි මී 500 හා පකාදරගම වානේ සිට කඹරු දක් වා කෘෂිපාර නඅත ම 750)	0.7	i. CMC හිදී සාකච්ඡා කිරීම. ii. ස්ථාන හදු නාගැනීම iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. iv. ඇස්තමේන්ත නිරීම හා කොන්ත්‍රාත් පැවරීම. v. ප්‍රගතිය පරීක්ෂාව	1. ගොවි සංවිධාන 2. CMC සහCSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා
07.	අංකිරිප්පව වැවේ පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් කරලා. අක් 01 ට ජලය ගන්න බෑ	0.2	i. CMCහිදී සාකච්ඡා කිරීම. ii. ස්ථාන හදු නාගැනීම iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. iv. ඇස්තමේන්ත නිරීම හා කොන්ත්‍රාත් පැවරීම. v. ප්‍රගතිය පරීක්ෂාව	1. ගොවි සංවිධාන 2. CMC සහCSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං දෙපා 4.පළාත් වාරිදෙපා
08.	වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්ත ඉතා දර්වලයි	0.2	i. CMC හිදී සාකච්ජාවට ගැනීම. ii. නඩත්ත වැඩ හඳුනා ගැනීම iii. ප්‍රමාණ මැනීම් කටයුතු සිදු කිරීම iv. ගොවි සංවිධාන දැනුවත් කිරීම v. නඩත්ත සැලැස්මක් සකස් කර ගොවි සංවිධාන මගින් ක්‍රියාත්මක කිරීම.	1. ගොවි සංවිධාන 2. CMC සහCSIAP ව්‍යාපෘතිය 3.ගොවිජන සං . දෙපා. 4.පළාත් වාරි. දෙපා. 5. ප . කෘ. දෙ.
09.	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම. ආක්‍රමණික ජලජ ශාක ජපන් ජබර,විල කටු	0.2	i. CMCහිදී සාකච්ජාවට ගැනීම. ii. ඇස්තමේන්ත කිරීම. iii. ජලය අඩුවීමත් සමග නිර්දේශිත කෘමි. නාශකයක් යෙදීම. iv. පවත්වාගෙන යාම.	1. ගොවි සංවිධාන 2.CMC සහ CSIAP ව්‍යාපෘතිය 3. ගොවිජන සං . දෙපා. 4. පළාත් වාරි. දෙපා. 5.ප . කෘ. දෙ.

6.අන්දරවැව එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව

උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම්	දළ පිරිවැය (රු.මි)	කාලරාමුව			ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත්වීම්	
		කෙටිකාලීන 2924	මධ්‍යකාලීන 2025	දිගුකාලීන	ප්‍රධාන	අනෙකුත්
1 වැවේ ජලය වගාවට ප්‍රමානවත් නැත (වාන පහත් කරලා) නියමිත මට්ටමට වාන ඉස්සීම පනාදරගමවැව කුඩා වැව	0.3				1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග දෙ 5. කෘ දෙ	• දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය • ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
2 කට්ටකඩුව හා පෙරණය නැත. නැවත ස්ථාපිත කිරීම පනාදරගමවැව කුඩා වැ තම්මැන්නාව අංකිරිප්පුව	0.2				1. ගොවි සංවිධාන 2. CSIAP	• ගොවි සංවිධාන • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග

																3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	
3 රක්ෂිත අල්ලාගෙන ඇත වැවේ රක්ෂිතය සළකුණු කර අනවසර කරුවන් ඉවත් කිරීම පනාදරගමවැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව	0.3															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග
4 ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම. ඇල සකස් කිරීම (කුඹුරු විනාශවී ඇත . පනාදරගම)	0.4															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග
5 වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවත සේදී වැවට එකතු වී වැව ගොඩවීම. පස් වැටිය සකස් කර පෙරණය දැමීම wä 4 muK උස È. óg¾ 300පමණ mkdor.u	0.3															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග
6 කෘෂි පාර නැත . කෘෂිපාර අලත්වැඩියාව (කට්ටකඩුවේ සිට අංකිරිප්පව දක්වා මී 500 හා පකාදරගම වානේ සිට කුඹුරු දක්වා කෘෂි පාර නැත මී 750)	0.7															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග

7. අංකිරිප්පව පැවති වේල්ල කොන්ත්‍රාත්කරු ඉවත් කරලා අක් 01 ට ජලය ගන්න බෑ. ඇල නැවත අලත්වඩියා කිරීම.	0.2															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග
8 වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්ත ඉතා දුර්වලයි. විධිමත් නඩත්තු වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම.	0.2															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන/ ගොවීන් • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග
9 ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම. ආක්‍රමණික ජලජ ශාක ජපන් ජබර, විල කටු	0.2															1. ගොවි සංවිධාන 2. CSIAP 3. ගොවිජන සං දෙ 4. පළාත් වාරිමාර්ග	• ගොවි සංවිධාන/ ගොවීන් • CSIAP • ගොවිජන සං දෙ • පළාත් වාරිමාර්ග

7. මැඩිල්ල අමුණ එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තුව

අනු අංක	දළ ඇස්තමේන්තුගත වියදම / සහ යෝජිත ප්‍රධානක්‍රියාකාරකම් තම්මැන්නාව එල්ලංගාව	ආසන්න වියදම් (රු.)	2024/2025							
			ඔ/නො	දෙ/ජන	මා/අප්‍රි	මැ/ජ	ජ/අ	සැ/ඔ	නෙ/ දෙ	
1	1 පනාදරගම වැවේ වැව් ජලය වගාවට ප්‍රමාණවත් නැත. (වාන පාහත්)	0.3								
2	2 කට්ටකඩුව හා පෙරණය නැත. පනාදරගමවැව කුඩා වැව තම්මැන්නාව අංකිරිප්පව	0.6								
3	3 රක්ෂිත අල්ලාගෙන ඇත. පනාදරගමවැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව _	0.4								
4	4 ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම. (කුඹුරු විනාශවී ඇත .පනාදරගම)	0.4								
5	5 පුණරුත්ථාපණයේදී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවක සේදී වැවට එකතුවී වැව ගොඩවීම. (wä 4 muK උස È. óg¾ 300පමණ) mkdor.u	0.4								
6	6 කෘෂි පාර නැත. (කට්ටකඩුව සිට අංකිරිප්පව දක්වා මී 500 හා පනාදරගම වානේ සිට කුඹුරු දක්වා කෘෂිපාර නැත මී 750)	0.2								
7	අංකිරිප්පව පැවති වේල්ල කොන්ත්‍රාත්කරු ඉවත් කරලා අක් 01 ට ජලය ගන්න බෑ	0.2								
8	වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්ත ඉතා දර්වලයි.	0.2								

9	ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම.	0.2									
	මුළු	2.4									